වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2018

----------------------------------------------------------

1. මතය

------

1.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සභාවේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.10,066,421 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණනය කිරීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මේ වන විටත් එම කටයුතු සිදු කරමින් පවතී. මේ පිළිබඳව වාර්තාවක් මාස 03ක් ඇතුලත ලබාදෙන මෙන් දක්වා තිබුණි. | ගිණුම් තැබීමේදී රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුගතවිය යුතු වීම. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) සභාවේ ලේකම් කාර්යාලය විසින් විවිධ වැඩසටහන් වෙනුවෙන් දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදෙන ලද අත්තිකාරම් මුදල් අත්තිකාරම් ලෙස ගිණුම්ගත නොකර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර වියදම් නොකර ආපසු එවන ලද රු.2,392,508 ක් වූ මුදල් අදාල වියදමින් අඩුනොකර ජංගම බැරකම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | 2019 අවසාන ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අත්තිකාරම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කිරීම අවසන්වූ වත්කමකට නැවත රු.180,000 ක් ක්ෂය කිරීමේ හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම අගයෙන් අඩුවෙන් දැක්විණි. | 2019 අවසාන ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දක්වා තිබුණි. | වත්කම් සඳහා ක්ෂය ගණනය කිරීම නිවැරදිව කළ යුතු වීම. |

## 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| පාසැල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 9,102,500 | මෙම වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 331 ට රු.27,500 බැගින් රු9,102,500 ක් ලබාදී තිබුණු නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 100 ක් අදාල වැඩසටහන පැවැත්වූ බවට තහවුරු කිරීමට අදාල තහවුරු ලියවිලි ලේකම් කාර්යාලය විසින් ලබාගෙන නොතිබුණි. | මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කින් පමනක් වැඩසටහනෙහි අත්තිකාරම් පියවා අදාල වියදම් වාර්ථා ගෙන්වාගෙන නොමැති අතර ඒවා හැකි ඉක්මනින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙවැනි අතපසුවීමක් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගනු ලැබේ. | අත්තිකාරම් වශයෙන් ලබාදුන් මුදල් අදාළ කාර්යය වෙනුවෙන් වියදම් කර ඇතිබවට තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.5 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 371(5) | අත්තිකාරම් දෙන ලද කාර්යය නිමකල විගස පියවිය යුතු වුවත් දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලට ලබාදී තිබුනු එකතුව රු.6,820,611 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් නිරවුල් කර නොතිබුණි. | මේ වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කින් පමණක් වැඩසටහනෙහි අත්තිකාරම් පියවා අදාල වියදම් වාර්තා ගෙන්වාගෙන නොමැති අතර ඒවා හැකි ඉක්මනින් ගෙන්වා ගැනීමට කටයුතු කරනු ලැබේ. මෙවැනි අතපසුවීමක් ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගන්නෙමු. | අත්තිකාරම් වශයෙන් ලබාදුන් මුදල් අදාල වර්ෂය තුළදීම පියවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය | එම වගන්තියෙහි දැක්වෙන කරුණු ඇතුළත්ව සංයුක්ත සැළැස්මක් සකස් කළ යුතු වුවද, ආයතනය 2018 වර්ෂය ඇතුළත් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැළැස්මක් සකස් කර නොතිබුණි. | වර්ෂ 03 ක් පදනම් කර ගනිමින් සංයුක්ත සැලැස්මක් මේ වන විට පිළියෙළ කර නොමැති අතර 2020 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් සකස් කර පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ. | මහ ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලීන සැළසුම් ඇතුළත් සංයුක්ත සැළැස්ම සකස් කළ යුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු3,867,929 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 591,468 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,459,396 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට වෙනත් මෙහෙයුම් වියදම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහා භාණ්ඩාගාරය විසින් වයස අවුරුදු 70 ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා ලබා දෙන රු.2,000 ක් වූ වැඩිහිටි දීමනාවෙන් 2016 අගෝස්තු 31 දින අමාත්‍ය මණ්ඩල තීරණයක් මත රු.100 ක් අඩුකර වැඩිහිටි මහ ලේකම් කාර්යාලය වෙත ලබා ගෙන වැඩිහිටි ආරක්ෂණ අරමුදල නමින් ගිණුමකට බැරකර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු.490,825,200 ක් මෙම අරමුදලට බැරවිය යුතුව තිබුණද, රු. 5,357,900 ක් අඩුවෙන් බැර කර තිබුණි. එසේ වුවත් හිඟ මුදල් එකතු කර ගැනීම සඳහා මහ ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු මුදලින් රු.366,500,000 ක් රාජ්‍ය බැංකු 03 ක ස්ථාවර බැංකුවල තැන්පතුවල ආයෝජනය කර තිබුණි. එසේම 2016 වර්ෂයේ සිට 2018 දෙසැම්බර් 31 දක්වා මෙම අරමුදලට | වයස අවුරුදු 70 ඉක්මවූ අඩුආදායම්ලාභී වැඩිහිටියන් සඳහා මාසිකව දෙනු ලබන රු.2,000 දීමනාවෙන් රු.100 ක මුදලක් අවකරණය කොට සකසන ලද වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලෙන් සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් අඩංගු ක්‍රියාකාරි සැලැස්මද මේ වන විට අනුමත කරගෙන ඇත. මේ වන විට ක්‍රියාකාරී සැලැස්මේ වෛද්‍ය සායන වෙනුවෙන් වෙන් කර ඇති මුදලින් මාස 6ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත මුදල් නිදහස් කර ඇත. | අරමුදලක් පිහිටුවීම සඳහා භාණ්ඩාගාරයේ නීත්‍යානුකූල අවසරය ලබා ගත යුතු අතර අදාළ මුදල් මගින් ඉටුකිරීමට අපේක්ෂිත වූ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා අවධානය යොමුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | බැර වී තිබුණු රු.1,476,158,823 ක් වූ මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කිසිදු කර්තව්‍යකට උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර පැවතුණි. | | |
| (ආ) | අඩු ආදායම්ලාභී වැඩිහිටියන් වෙත ස්වයං රැකියා ආධාර මුදල් ලබාදීම සභාවේ කාර්යයක් වුවද එය සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්මට ඇතුළත් කර අනුමත කරගෙන නොතිබුණි කෙසේ වුවද ප්‍රාදේශිය ලේකම් කාර්යාල 47 ක් ආවරණය වන පරිදි රු.4,179,390 ක් වූ ආධාර මුදල් 2019 ජනවාරි 09 දින ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත තැපැල් කර තිබුණි. | අයදුම්පත්‍ර කැඳවීම ජුනි මස දක්වා කරන ලද අතර භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම මත ප්‍රතිලාභින්ට මුදල් ලබා දීම 2019 ජනවාරි 07 වන දින දක්වා ප්‍රමාදවී තිබුණි. | මෙම කාර්ය ආරම්භයේ සිටම ප්‍රමාද තත්ත්වයක පැවති බැවින් මෙවැනි කාර්යයන් මගින් සේවාව සැපයීමට හැකිවන පරිදි නිසි සැළසුම් සකස් කර ගත යුතු වීම. |
| (ඇ) | සංස්ථාපිත පනතට අනුව වැඩිහිටි තැනැත්තන් පිළිබඳ නිවැරදි හා යාවත්කාලීන කරන ලද සංඛ්‍යා ලේඛණ පවත්වාගෙන යාම සභාවේ එක් කාර්යයක් වන අතර ඒ සඳහා නිවැරදි දත්ත පද්ධතියක් පවත්වාගෙන යායුතු බවට පොදු ව්‍යාපාර කාරක සභාවේ 2016 පෙබරවාරි 11 දින පැවති රැස්වීමේදීද තීරණයක් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදීද වැඩිහිටි සමාජ ආරක්ෂණ අරමුදලින් රු.2,000,000 ක් මේ සඳහා වෙන්කර ගෙන තිබුණු නමුත් 2019 මැයි 22 දින තෙක්ම දත්ත පද්ධතිය යාවත්කාලීන කර නොතිබුණි. | මෙම දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා මේ වන විට අග්‍රාමාත්‍ය කාර්යාලය එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල සමග සාකච්ඡා පවත්වා ඇති අතර අප ආයතනයට වන තොරතුරු සන්නිවේදන තාක්ෂණ අංශය ස්ථාපිත කිරීමෙන් පසු මෙහි ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. | මහ ලේකම් කාර්යාලය විසින් මෙම දත්ත පද්ධති සකස් කිරීම ප්‍රමාද තත්ත්වයක පවතින බැවින් අප්‍රමාදව මෙම දත්ත පද්ධතිය නිවැරදි කර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වයසස අවුරුදු 75 දක්වාවූ ජොෂ්ය පුරවැසියන් වෙනුවෙන් වෛද්‍ය රක්ෂණ ක්‍රමයක් ඇතිකිරීම සහ අවුරුදු 65 ට වැඩි වැඩිහිටියන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් වැඩිහිටි තැනැත්තන් සඳහාවූ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම 2016 වර්ෂයේදී ආරම්භ කර තිබුණු නමුත් 2019 මැයි 31 දිනවන විට වර්ෂ 03 ක් ගතවී තිබුණද එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර නොතිබුණි. | වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය සඳහා මේ වන විට කැබිනට් අනුමැතිය ලැබී ඇති අතර මීළඟ පියවර ලෙස ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | මෙම ප්‍රතිපත්තිය අනුමත කර ක්‍රියාත්මක කිරීමට කඩිනම් පියවර ගත යුතු වීම. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දී වැඩිහිටි දිනය සැමරුම වෙනුවෙන් රු.10,560,000 ක් වැය කර පළාත් මට්ටමින් වැඩසටහන් 08 ක් සහ ප්‍රාදේශීය මට්ටමින් වැඩසටහන් 200 ක් පැවැත්වීමට සැළසුම් කර තිබුණි. කෙසේ වුවද, පළාත් මට්ටමින් පැවැත්වීමට නියමිත වූ වැඩසටහන් 08 පවත්වා නොතිබුණු නමුත් අනෙකුත් සැමරුම් උත්සව වෙනුවෙන් රු.17,528,976 ක් වැයකර තිබුණි. එසේම ප්‍රාදේශීය සැමරුම් වැඩසටහන් සඳහා ප්‍රාදේශිය ලේකම් කාර්යාල 331 ක් වෙත රු.3,241,607 ක් ලබාදී තිබුණු අතර එම මුදල් ලබාදෙන අවස්ථාවේම වියදමක් වශයෙන් හඳුනාගෙන තිබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එම මුදල් වැය කළ ආකාරය පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි. | එමෙන්ම ප්‍රාදේශිය ලේකම් කාර්යාල වලින් ලැබී නොමැති තොරතුරු අංක NSE/DEV/01/03/1 හා 2019.02.14 දිනැති ලිපිය මගින් සිහිකැඳවීම් යොමුකර අදාල තොරතුරු ලබාගැනීමට කටයුතු කරන ලදී. | මහ ලේකම් කාර්යාලය විසින් මෙම වැඩසටහන් පැවැත්වීම සඳහා දරන ලද වියදම් සම්බන්ධයෙන් සහ පසුවිපරම් කිරීම සම්බන්ධව අවධානය යොමුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂය සඳහා මහ ලේකම් කාර්යාලය විසින් මාධ්‍ය වැඩසටහන් පැවැත්වීමට රු.7,600,000 ක් ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණු නමුත් වර්ෂය තුළ වැයකළ මුදල රු. 975,510 ක් පමණක් වී තිබුණි. | අමාත්‍යාංශය මගින් මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු යොදා තිබුණු බැවින් ආයතනයක් ලෙසට වෙනම වියදමක් දරමින් මාධ්‍ය වැඩසටහන් පැවැත්වීමේ අවශ්‍යතාවයක් නොමැති බව තිරණය විය. | ප්‍රතිපාදන වෙන්කර ගැනීමේදී අවශ්‍යතාවයන් නිවැරදිව හඳුනා ගත යුතු වීම. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | --------------------------------- | ------------ |
| වැඩිහිටි සත්කාරක සහකරුවන් 100 ක් බඳවාගෙන පුහුණු කිරිම, වැඩිහිටියන් සතු සම්ප්‍රදායික හා දේශීය සුපවේදී ක්‍රම සමාජය තුල ප්‍රවර්ධනයට අත්තම්මා කේටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම යන කාර්යයන් සහ මහ ලේකම් කාර්යාලය විසින් වැඩිහිටියන්ගේ සුභ සාධනය වෙනුවෙන් ප්‍රධාන කාර්යයන් 03 ක් ඉටුකිරීම වෙනුවෙන් වර්ෂය තුළ ප්‍රතිපාදනය කර ගෙන තිබූ මුදල රු.263,330,000 ක් වූ නමුත් එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය මූලික කටයුතු නොකිරීම නිසා සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි. | තෘතික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතිචාරයක් නොවූ නිසා වැඩිහිටි සත්කාරක සහකාරවරුන්ගේ පාඨමාලාව ආරම්භ කිරීමට නොහැකිවූ බවත්, ඉඩම් අත්පත් කර ගැනීමේ හා ආකෘති ගෘහනිර්මාණ සැලසුම සකස් කිරීමේ ප්‍රමාදයන් නිසා අවන්හල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සමාලෝචිත වර්ෂය තුල සිදුකිරීමට නොහැකිවී තිබුණි.<br>වැඩිහිටි ආරක්ෂණ අරමුදලට අදාලව ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොමැති නිසා එම කාර්යයන් සිදු කර නොතිබුණි. | මහ ලේකම් කාර්යාලයට ක්‍රියාත්මක කිරීමට හැකිවන ආකාරයේ වැඩ සටහන් පමණක් සැළසුම් කර ගත යුතු වීම. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැඩිහිටි නිවාස ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී තෑගි ඔප්පු මගින් ලැබී තිබුණු ගම්පහ හෝලික්‍රොස් ඉඩම සහ හාරගම රාජිත වත්ත ඉඩම අදාල කාර්ය ඉටුකර ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් නිශ්ක්‍රීයව පැවතිණි. | ගම්පහ හෝලික්‍රොස් ඉඩම හා ගොඩනැගිල්ල තක්සේරු කර ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මහනුවර ගුරුදෙණිය හාරගම ඉඩමේ ඉදිකිරීම් කටයුතු ඉඩම් අමාත්‍යාංශය මගින් ඉටුකරන බව දන්වා ඇත. | පරිත්‍යාග ලෙස ලැබුණු ඉඩම් අදාළ කර්තව්‍යයන් ඉටුකර ගැනීමට ලේකම් කාර්යාලය වෙත අප්‍රමාදව පවරා ගැනීමට කටයුතු සිදුකර ගත යුතු වීම. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ තනතුරක් සහ නීති නිලධාරී තනතුර දීර්ඝ කාලයක සිටද, පරිපාලන නිලධාරී තනතුර 2018 මාර්තු සිටද පුරප්පාඩුව පැවතිණි. | නීති නිලධාරී - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබී ඇත්තේ ඇත්තේ නීති නිලධාරී තනතුරක් සඳහා නොව නීති සහකාර තනතුරක් බැවින් එම තනතුර වෙනස් කර ගැනීමටත්, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන) සම්මුඛ පරීක්ෂණය පවත්වා බඳවාගැනීමට කටයුතු සිදු කරමින් පවතින අතර පරිපාලන නිළධාරී සඳහා නිලධාරියකු බඳවාගැනීමට කටයුතු සිදු කරයි. | පුරප්පාඩු සඳහා කඩිනමින් කාර්ය මණ්ඩල බඳවා ගැනීමට කටයුතු කළ යුතු වීම. |